# හින්දියෙහි නාම විශේෂණ

ලක්ෂ්මන් සෙනෙවිරත්න

This article aims to present an analysis of adjectives in Hindi, a Modern Indo Aryan Language. With regard to adjective-noun agreement, Hindi displays two types of adjectives: tulya:dhikərəṇa (feature agreement) and bhinna:dhikərəṇa (non-feature or broken agreement). This division is identified on the basis of endings of the forms concerned. -ā ending adjectives show feature agreement and -ī endings and consonant endings are non-agreeing adjectives. Feature agreements are found in Hindi adjectives. The adjective agreements of different catagories are delt with here in some detail, along with gender, number and case agreements.

## 0.0 හැඳින්වීම:

නූතන ඉන්දු-ආර්ය භාෂාවක් වන හින්දි භාෂාවේ නාම විශේෂණ භාවිතය පිළිබඳ විග්‍රහයක් කිරීම මෙම ලිපියේ අරමුණ වේ. හින්දියෙහි විශේෂණ-විශේෂ්‍ය අධිකරණය, විශේෂණ භාවිතය හා විශේෂණ වර්ග පිළිබඳ මෙහි දී සලකා බැලේ.

## 1.0 නාම විශේෂණ හා විශේෂ්‍යය:

නාම විශේෂණ යනු නාම පදයකට විකාශනයක්, විස්තරයක් වශයෙන් යෙදෙන පදයි. එසේ විශේෂණය කරනු ලබන පදය විශේෂ්‍යය යනුවෙන් හැඳින්වෙයි.[1]

sundər fu:l - सुन्दर फूल - ලස්සන මල

මෙහි sundər (सुन्दर) යන වචනය විශේෂණය වන අතර fu:l

---

© ලක්ෂ්මන් සෙනෙවිරත්න
සුදුරුකුසුම් සාහිත්‍ය හිමි, මැණික් ගුණසේකර, නිමල් පරවානෙ, උපුල් රංජිත් හේවාවිතානගමගේ සංස්., 1999, මානව ශාස්ත්‍ර පීඨ ශාස්ත්‍රීය සංග්‍රහය, කැලණිය විශ්වවිද්‍යාලය.